# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

7 ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

### I කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන අර්ථය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. මල්ලී සර්පයෙකු දෙස **<u>ගල් ගිල්ලාක් මෙන්</u>** බලා සිටියේය.
   1) කුතුහලයෙන් 3) සැකයෙන්
   2) බියෙන් 4) කෝපයෙන්

2. "**<u>මූණේ දැලි ගෑවෙන</u>** වැඩ කරන්න එපා" යැයි තාත්තා දරුවන්ට කීවේය.
   1) අවනම්බුවක් ගෙන දෙන 3) නොහික්මුණු වැඩ
   2) මුහුණ අපිරිසිදු වන 4) වුවමනා නැති

- අංක 03 සිට 05 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට සුදුසු පදය තෝරන්න.

3. කාලයෙන් කාලයට භාෂාව වෙනස් වීමත් සමඟ ම ජන කවිය ද වෙනස් වීම …………….. ය.
   1) නිර්මාණාත්මක 3) ස්වභාවික
   2) අස්වාභාවික 4) සාමූහික

4. සවන් දී ප්‍රතිචාර දැක්වීමේදී අප අතර සුහදතාව …………….. කර ගැනීම ඉතා වැදගත් වෙයි.
   1) ප්‍රදර්ශනය 3) මර්දනය
   2) ප්‍රකාශනය 4) වර්ධනය

5. වීරසිංහ ප්‍රතිරාජ අමාත්‍යවරයාගේ ඉල්ලීමක් පරිදි පන්සිය පනස් ජාතක පොත …………….. සාහිත්‍ය යුගයේ රචනා කරන ලදී.
   1) කුරුණෑගල 3) කෝට්ටේ
   2) දඹදෙණි 4) මහනුවර

6. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී නැති වචනය තෝරන්න.
   1) ප්‍රතිඵල 3) අවශේෂ
   2) ලේඛනය 4) ප්‍රභවය

7. සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.
   1) හඬ 2) අඩ 3) අඹ 4) මඟ

- අංක 08 - 09 ප්‍රශ්නවල සඳහන් පද පේළිවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

8. 1. මකරන්ධ 2. අන්ද 3. චන්ධන 4. සුගන්ධ

9. 1. දූෂණ 2. පාෂාන 3. තෘෂ්නාව 4. ප්‍රනාම

10. සමානාර්ථ පද ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
    1) චන්ද්‍රයා - සඳ 3) මව - මෑණී
    2) මුහුණ - ගත 4) අහස - නුඹ

11. විරුද්ධාර්ථවත් පද ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

1) වේලාව - අවේලාව
2) නම්බුව - අවනම්බුව
3) පිරිසිදු - සුපිරිසිදු
4) කීර්තිය - අපකීර්තිය

12. වී ගොවිතැන හා බැඳුණු භාෂා ව්‍යවහාරයේදී "රසබෝය, කිරි කබළු" යනුවෙන් හඳුන්වන්නේ,

1) ආප්ප , හකුරු
2) තේ , හකුරු
3) හකුරු , ආප්ප
4) හකුරු, කිරි

13. ඉරිඇඳි පදවල ක්‍රියාපද වර්ගය තෝරන්න.

අම්මා ආහාර **පිස** දරුවන්ට **කවමින්** **සිටියාය**.

1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
3) පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
4) අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා

14. ''සරණිය, කිකිණිය, ගිහිණිය, රමණිය'' යනුවෙන් සමාන ශබ්ද එකිනෙකට නින්නාද වන අයුරින් යොදන කාව්‍ය උපක්‍රමය හඳුන්වන්නේ,

1) අනුප්‍රාසය
2) විරිත
3) උපමාව
4) රූපක

15. පිළිවෙළින් මුල් අකුරේ ''කෙටි ඉස්පිල්ල, කෙටි පාපිල්ල, කොම්බුව'' නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1) සිනාව, පැනය, නොමැති
2) නිළිය, රුවන්, තෙපි
3) නිමාව, දැනෙන, යෙදීම
4) කියන, රුවකි, පොහොය

16. ''කාන්තාවෝ, ගැමියෙක්'' යන උක්ත පදවල අනුක්ත රූපය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

1) කාන්තාවන්, ගැමියකු
2) කාන්තාවක, ගැමියා
3) කාන්තාවන්, ගැමියන්
4) කාන්තාවක, ගැමියකු

17. සිංහල භාෂාවේ උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ බහුවචන නාම පද නිවැරදිව පිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරන්න.

1) මම, තොපි, ළමයි
2) මම, නුඹ, ඔවුහු
3) අපි, නුඹ, ඔවුහු
4) අපි, තොපි, ළමයි

18. රාජකාරී ලිපියක මූලිකාංග නිවැරදිව අනුපිළිවෙළට දැක්වෙන පිළිතුර තෝරන්න.

1) දිනය, ආමන්ත්‍රණය, යවන්නාගේ ලිපිනය, ලබන්නාගේ ලිපිනය
2) යවන්නාගේ ලිපිනය, ලබන්නාගේ ලිපිනය, දිනය, ආමන්ත්‍රණය,
3) යවන්නාගේ ලිපිනය, දිනය, ලබන්නාගේ ලිපිනය, ආමන්ත්‍රණය
4) දිනය, ආමන්ත්‍රණය, ලබන්නාගේ ලිපිනය, යවන්නාගේ ලිපිනය

- හිස්තැනට ගැළපෙන උක්ත පදය තෝරන්න.

19. දිසාපාමොක් …………….. ශිෂ්‍යයන් ශිල්ප ශාස්ත්‍ර උගන්නා මිදුලෙහි සක්මන් කොට සිටියාහ.

1) ආචාරීන්
2) ආචාරීහු
3) ආචාරියා
4) ආචාරියෙක්

20. ඝන ලොම් තට්ටුවකින් අලංකාර වූ …………….. තුරු මත හිඳ බුකු! බුකු! හඬ නගති.

1) වානරයෝ
2) වානරයා
3) වානරයකු
4) වානරයන්

(ල.$2 \times 20 = 40$)

## II කොටස

- 1, 2 ප්‍රශ්න අනිවාර්ය වේ. 3, 4, 5, 6, 7 ප්‍රශ්න තුළින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

1. පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ජනකවි රැස් කර, ඔබ සකස් කළ කවි පොත ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.
    i. පොත් පිංච සඳහා යෙදූ නම කුමක්ද? (ල. 2)
    ii. කවි පොත නිර්මාණයේදී සැලකිල්ලට ගත් මූලික කරුණු 02ක් ලියන්න. (ල. 4)
    iii. නිර්මාණය සඳහා ගුරුතුමියගෙන් ලැබුණු උපදෙස් 02ක් ලියන්න. (ල. 4)
    iv. කවි පොත සකස් කිරීමට තොරතුරු ලබාගත් මූලාශ්‍ර 02ක් ලියන්න. (ල. 4)
    v. පොත් පිංච නිර්මාණයෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන 02ක් ලියන්න. (ල. 2)

(මුළු ලකුණු - 16)

2. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.
    i. ශ්‍රී ලංකාවේ අභිකුණ්ඨික ජනතාව
    ii. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය දියුණු කරමු
    iii. ඉගෙනීමේ අගය
    iv. සුන්දර පරිසරය අසිරිමත්ය
    v. උදාරයි මගේ මව්බිම

(ල. 14)

3. අයාලේ යන බල්ලන් නිසා ඔබ ප්‍රදේශයේ ජලභීතිකා රෝගය වර්ධනය වෙමින් පවතී. එය මර්දනය කිරීම පිණිස අවශ්‍ය පියවර ගන්නා ලෙස දන්වමින් ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට ප්‍රදේශයේ ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතා ලිපියක් ලියන්න.

(ල. 10)

4. පහත දී ඇති ප්‍රකාශ කවුරුන් විසින් කාහට කරන ලද්දේ දැයි ලියන්න.

| | ප්‍රකාශය | කවුරුන් විසින් | කා හටද |
|---|---|---|---|
| (අ) | ''මං ලොකු වුණාම ටිකට් විකුණන කෙනෙක් වෙන්න ඕන'' | | |
| (ආ) | ''නෑ තලයට මිල එපයි, ඉතිබ්බේ මගේ තල නොකන ලෙස අවවාද කියව'' | | |
| (ඉ) | පුතේ අම්මාගෙන් යතුර ඉල්ලගෙන එන්න. | | |
| (ඊ) | කම්මැලි රාල ! මම වැඩ පටන් ගත්තා විතරයි. | | |
| (උ) | ''එහෙ ගියොත් සුදු අප්පොත් එක්ක සෙල්ලම් කරතැකි. | | |

(ල.$2 \times 5 = 10$)

5. සිලිලාරෙක හෙල් මැලි

පෙති අතරින් **<u>සැලී සැලී</u>**

කනට නොයන සිතට දැනෙන

.................................

i. මෙම පද්‍යයේ අවසන් පද පේළිය සම්පූර්ණ කරන්න.

ii. මෙම පද්‍ය උපුටා ගත් කෘතිය නම් කරන්න.

iii. ඉහත කවිය ඇතුළත් පාඩමේ නම කුමක්ද?

iv. ඉහත පද්‍ය රචනා කරන ලද්දේ කවුද?

v. 'සැලී සැලී' යන ඉරි ඇඳි පදයේ කාව්‍ය උපක්‍රමය කුමක්ද?

(ල.$2 \times 5 = 10$)

6. පහත වාක්‍ය නිවැරදි කර ලියන්න.

i. නුඹලා හොඳින් පාඩම් කරන්නෙහි ද?

ii. විනිසුරුතුමා අධිකරණ භූමියෙන් පිටත් වූහ.

iii. අහසෙහි වැහි වළාකුළු පාවී යති.

iv. උපාසිකාවන් සිල් සමාදන් වූහ.

v. අපි පෙරහැර නැරඹීමට ගියෙමි.

(ල.$2 \times 5 = 10$)

7. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සුබ දිනයක දෙවියන්ට භාරහාර වී මහියංගනය ප්‍රදේශයේ ගොවියෝ ගොවිතැන් කටයුතු ආරම්භ කරති. ප්‍රථම කාර්යය වන්නේ කුඹුරු සෑමයි. ඒ සඳහා මී ගොන් බැඳීම කෙරෙන්නේ සුබ දිනයක, සුබ නැකතකට ය.

වැපිරීමට අවශ්‍ය වී වතුර වලක එක් දිනක් තබා කෙසෙල් කොළවල අතුරනු ලබයි. දින 7ක් මෙසේ කමත වී පැළ වූ පසු කුඹුරට ගෙන යාමට පෙර බැලතණ, එළමල්, ලුණු ස්වල්පයක් ඉසීම සිරිතකි.

ගොයම් මුල් වේයන්ගෙන් ආරක්ෂා කර ගැනීමට මහපට්ටා අතු එළා වක්කඩ මුල තබනු ලැබේ.

i. මහියංගන ප්‍රදේශයේ වී ගොවිතැනේ මුල් ම කටයුතු වන්නේ කුමක්ද?

ii. මී ගොන් බැඳීම සඳහා යොදා ගනු ලබන්නේ කුමක්ද?

iii. පොඟවන ලද වී අතුරා තබන්නේ කුමකද?

iv. වී බිම අතුරන කාල සීමාව කොපමණද?

v. ගොයම් මුල් වේයන්ගෙන් ආරක්ෂා කිරීමට ගොවියන් යොදා ගන්නේ කුමක්ද?

(ල.$2 \times 5 = 10$)